දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක **20/2018**

PH/CF/CA/2/BUDGET/APACACC/2018,

මුදල් අංශය,

බන්ධනාගාර මූලස්ථානය,

කොළඹ 09.

2018-12-06

සියළුම කොමසාරිස්වරුන්,

සියළුම මාණ්ඩලික නිළධාරීන්,

සියළුම බන්ධනාගාර අධිකාරීවරුන්, සහකාර අධිකාරීවරුන්.

<u>2018 වර්ෂය සඳහා ගිණුම් පියවීම</u>

2018 වර්ෂය සඳහා ගිණුම් පියවීම සම්බන්ධව රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 266/2018 හා 2018-10-19 දිනැති චක්‍රලේඛය හා භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 06/2018 හා 2018-11-05 දිනැති චක්‍රලේඛයන්ට අනුකූලව බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් 2018 මුදල් වර්ෂයට අදාල ගිණුම් පියවීම් කටයුතු සිදු කරයි. ඉහත දක්වා ඇති චක්‍රලේඛයන් www.treasury.gov.lk යන වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැක. ඒ අනුව 2018 වර්ෂයේ ගිණුම් පියවීමේ කටයුතු පහත උපදෙස් පරිදි සිදු කල යුතු බව අවධාරණය කරණු ලැබේ.

**01. 2018 දෙසැම්බර් මාසය සඳහා ප්‍රතිපාදන හා අක්මුදල් ලබා ගැනීම.**

i. බන්ධනාගාර දෙපාර්තමේන්තුව සඳහා 2018 වර්ෂය වෙනුවෙන් විසර්ජන අයවැය මගින් පරිපාලන හා ආයතනික සේවා ව්‍යාපෘතිය වෙනුවෙන් වන වැය බාන්ඩ යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන මේ වන විට අවසන් වෙමින් පවතින බැවින් ලබාගත් අත්තිකාරම් නිරවුල් කිරීමට ප්‍රමුඛතාවය ලබා දෙමින් අවශ්‍ය ප්‍රතිපාදන ඉල්ලුම් කිරීමට මෙන්ම වියදම් දැරීමට සියළුම බන්ධනාගාර ආයතන ප්‍රධානීන් වග බලා ගත යුතුය.

ii. 2018 දෙසැම්බර් මාසය සඳහා ඔබ ආයතනයට ලබා දෙන ප්‍රතිපාදන සීමාව ඉක්මවා ( ඒ ඒ වැය විෂයන් වලට අදාලව) කිසිදු ගෙවීමක් නොකිරීමට ආයතන ප්‍රධානීන් තරයේ වග බලාගත යුතුය. බන්ධනාගාර ආයතන වෙත ලබාගත යුතු සැපයුම් හා සේවා සඳහා වගකීම් ඇති කර ගැනිමට ප්‍රථම එම ගෙවීම් නිරවුල් කිරිමට ප්‍රමාණවත් තරම් වූ ප්‍රතිපාදන ඔබ වෙත වෙන් කොට ඇත්තේද යන්න පිළබඳව සැහිමකට පත්විය යුතුවේ. යම් හෙයකින් දෙසැම්බර් මාසය සඳහා ලබා දෙන ප්‍රතිපාදන හෝ අක් මුදල් ඉතිරි වන්නේ නම් ඒ පිළිබඳව කඩිනමින් බන්ධනාගාර කොමසාරිස් (මුදල්) වෙත විද්‍යුත් තැපැල් (commfinance@prisons.gov.lk /budget@prisons.gov.lk) මගින් හෝ ෆැක්ස් මගින් දැනුම් දීමට කටයුතු කල යුතුය.

iii. දෙපාර්තමේන්තුව සතු ප්‍රතිපාදන හා අත් මුදල් ප්‍රමාණය සැලකිල්ලට ගෙන නිරවුල් කල හැකි සියළුම බිල්පත් නිරවුල් කිරීමට දෙපාර්තමේන්තුවේ ගෙවීම් භාරව කටයුතු කරන සියළුම නිලධාරීන් වග බලා ගත යුතු අතර, ලබා දී ඇති සියළුම අත්තිකාරම් 2018/12/31 දිනට පෙර නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කල යුතුය. වෙන් කරන ලද ප්‍රතිපාදන සීමාව ඉක්මවා වියදම් නොදැරීමටත්, ප්‍රතිපාදන ඉතිරි නොවන ලෙස වියදම් දැරීමටත් කටයුතු කල යුතුවේ.

iv. 2018 වර්ෂයේ අවසන් කරන ලද සියළුම සැපයුම් හා සේවාවන් වලට අදාල ගෙවීම් වවුචර අදාල සැපයුම්කරුවන් වෙතින් කඩිනමින් ගෙන්වා ගැනීමට අදාල විෂය භාර නිලධාරීන් කටයුතු කල යුතු අතර එම වවුචර ගෙවීම් අංශ වෙත නොපමාව ලබා දීමටත් අදාල අංශ ප්‍රධානීන් වගබලා ගතයුතු වේ. මේ පිළිබඳව අදාල සැපයුම්කරුවන්ට ලිඛිතව දැනුම් දීමටත් පියවර ගත යුතුය.

**02. 2018 මුදල් වර්ෂයට අදාලව මුදල් පොත් පියවීම.**

i. **2018-12-31** වන සඳුදා දින සියළුම බන්ධනාගාර ආයතනයන් හා පුහුණු පාසල විසින් එදින ප.ව **12.00**ට මුදල් පොත් පියවීමට කටයුතු කල යුතුවේ. එබැවින් ගිණුම් අංශ නිලධාරීන් මෙන්ම ගිණුම් පියවීමට බලයලත් නිලධාරීන් ගිණුම් පියවීම් අවසන් වන තෙක් ආයතනය තුල එදිනට රැඳී සිටීමට වග බලා ගත යුතුවේ. බන්ධනාගාර දෙපාර්තමේන්තුව උප ආයතන රාශියකින් සමන්විත වන බැවින් හා ගිණුම් පියවීම ඉතා සංකීර්ණ වන බැවින් ද මේ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කල යුතුවේ.

ii. 2016 වර්ෂයේ සිට ඉදිරියට ශුන්‍ය පාද අයවැය ක්‍රමය (Zero Based Budgeting System) ක්‍රියාත්මක වන බැවින් 2018 වර්ෂයේදි සියළුම බන්ධනාගාර ආයතනවල 2018 දෙසැම්බර් 31 දිනට පෙර ගමන් වියදම්, ඉන්ධන අත්තිකාරම් හා සුළු අත්මුදල් ඇතුළු සියළුම අත්තිකාරම් සම්පූර්ණයෙන් පියවා ගැනීමට කටයුතු කල යුතුය. දෙසැම්බර් මස අවසන් සති දෙක තුල අත්‍යවශ්‍ය කරුණකට හැර අග්‍රිම අත්තිකාරම් ලබා නොදීමට ගෙවීම් බලධාරීන් වගබලා ගත යුතුය.

iii. **2018 වර්ෂය සඳහා ගිණුම් පියවනු ලබන සියළුම බන්ධනාගාර ආයතනයන් මුදල් පොත් පියවන දිනට මුදල් පොතේ ඉතිරි ශේෂයේ වටිනාකම බන්ධනාගාර කොමාසාරිස් ජනරාල්ගේ බොරැල්ල ලංකා බැංකු ශාඛාවේ ගිණුම් අංක 7041491 ට චෙක්පතක් ලියා මුදල් පොත ශූන්‍ය කළ යුතුය. 2018-12-31 දින මුදල් පොත පියවා එදිනම ප.ව. 03.00 ට පෙර ඉහත ගිණුමට, අදාල චෙක්පත බැර කල යුතුවේ. සියළුම ආයතන විසින් එම චෙක්පතේ ඡායා පිටපතක් හා බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ නිල බැංකු ගිණුමට(7041491) චෙක්පත බැර කල බවට තහවුරු කෙරෙන තැම්පතු පතෙහි (Cheque Deposit Slip) ඡායා පිටපතක්, ආවරණ ලිපිය සමග විද්‍යුත් තැපැල (commfinance@prisons.gov.lk) මගින් හෝ ෆැක්ස් මගින් බන්ධනාගාර කොමසාරිස් (මුදල්) වෙත එදිනම එවීමට කටයුතු කල යුතුය. මුදල් පොතේ ශේෂයක් නොමැති නම් ඒ පිළිබඳව ද, ලිඛිතව දැනුම් දීමට ඉහත පරිදි කටයුතු කල යුතුය. මේ සම්බන්ධයෙන් ඒ ඒ ආයතනයන්හි අධිකාරීන් / සහකාර අධිකාරීන් හා ප්‍රධාන ජේලර් වරුන් පෞද්ගලිකවම තම අවධානය යොමු කල යුතු බව අවධාරණය කෙරේ.**

iv. බන්ධනාගාර ආයතන වල ගිණුම් පියවීම සම්බන්ධව බලය පැවරූ නිලධාරීන්ගේ නාම ලේඛනය ඇමුණුම් 01 හි දක්වා ඇත. අදාල නිළධාරීන් ඒ ඒ ආයතන වල මුදල් පොත වැසීමේ වගකීම දැරිය යුතුය. 2018 වර්ෂය වෙනුවෙන් මුදල් පොත් වැසීමෙන් පසු කිසිදු ගෙවීමක් මුදල් පොතේ සටහන් කල නොහැකි වන පරිදි එක් එක් මුදල් පොත්වල එදිනට සටහන් කෙරෙන අවසාන සටහනට යටින් රතු තීන්තෙන් ඉරක් ඇඳ තම නම, තනතුර, අත්සන, දිනය හා වේලාව සටහන් කර 2018 වර්ෂයේ මුදල් පොත නියමිත පරිදි වැසූ බවට සටහන් තැබිය යුතුය.

v. 2019 වර්ෂය සඳහා අවශ්‍ය අක් මුදල් බන්ධනාගාර මූලස්ථානය මගින් ලබා දෙන බැවින් කිසිදු අග්‍රිම ශේෂයක් බන්ධනාගාර ආයතන විසින් රඳවා තබා ගැනීමට කටයුතු නොකල යුතු බව අවධාරණය කරමි.

**03. මාසික ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

i. 2018 දෙසැම්බර් 28 වන දින වන විට සිදුකර ඇති සියළු ගෙවීම් ගිණුම්ගත කොට කෙටුම්පත් ගිණුම් සාරාංශයක් මේ සමග ඇති ඇමුණුම් අංක 02 යටතේ වන ආකෘතිය ප්‍රකාරව එවීමට කටයුතු කල යුතු අතර එදිනට මුදල් පොතේ ශේෂය ද නිවැරදිව දැක්වීමට කටයුතු කල යුතුවේ.

ii. 2018 දෙසැම්බර් මස ගිණුම් සාරාංශය 2019-01-04- වන දිනට පෙර ලබා දිය යුතුය. පලමු වන ගිණුම් සාරාංශයේ යම්කිසි ගිණුම්කරණ දෝෂයක් නිවැරදි කිරීම හෝ හරස් සටහන් මගින් කරනු ලබන ගෙවීමක් ගිණුම්ගත කිරීමට ඇත්නම් ඒ සඳහා පරිපූරක ගිණුම් සාරාංශයක් ඉදිරිපත් කල හැක. පරිපූරක ගිණුම් සාරාංශය 2019-01-10 වන දිනට පෙර ලබා දිය යුතුය.

iii. ගිණුම් පියවීමේ කටයුතු සම්බන්ධව යම් පැහැදිලි කරගැනීමක් වෙතොත් දුරකථන අංක 011 4677116/ 011 4677125 මගින් බන්ධනාගාර කොමසාරිස් (මුදල්) අමතන මෙන් කාරුණිකව දන්වමි. කාර්මික හා කෘෂිකාර්මික ගිණුමට අදාලව ගිණුම් හා මුදල් පොත පියවීම සම්බන්ධව වෙනමම චක්‍රලේඛයක් නිකුත් කර ඇති බව වැඩි දුරටත් දන්වමි.

එච්.එම්.එන්.සී. ධනසිංහ,
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.

පිටපත:- 01. විගණකාධිපති - දැ.ගැ.පි
02. බන්ධනාගාර කොමසාරිස් (අභ්‍යන්තර විගණන) - අ.ක.ස

( ඇමුණුම 01 )

2018 වර්ෂයේ ගිණුම් පියවීම සඳහා බලය පැවරූ නිලධාරීන්ගේ නාම ලේඛණය

බන්ධනාගාර දෙපාර්තමේන්තුව

| # | # | නිලධාරියාගේ නම | තනතුරු නාමය | ආයතනය |
|---|---|---|---|---|
| 1 | BC | එච්.සී.ඩබ්. කාරියවසම් | බන්ධනාගාර කොමසාරිස් මුදල් | මූලස්ථානය |
| 2 | B1 | ටී.අයි. උඩුවර | වි.ශ්‍රේ. බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | වැලිකඩ |
| 3 | B2 | එල්.ජේ.එම්.කේ. බණ්ඩාර | බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | කොළඹ රිමාන්ඩ් |
| 4 | B3 | එස්.ආර්. ජයවීර ද සිල්වා | බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | මැගසින් |
| 5 | B4 | කේ.ඒ.එස්. කොඩිතුවක්කු | බන්ධනාගාර අධිකාරී | මහර |
| 6 | B5 | ආර්.එස්. අලහකෝන් | බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | ප.වි.පු.ම |
| 7 | B6 | එච්.ඒ.සී. පෙරේරා | සහකාර බන්ධනාගාර අධිකාරී | මීගමුව |
| 8 | B7 | ආර්.එම්.එස්. බණ්ඩාර | බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | මහනුවර |
| 9 | B8 | යූ.ජී.ඩබ්. තෙන්නකෝන් | සහකාර බන්ධනාගාර අධිකාරී | පල්ලේකැලේ |
| 10 | B9 | ඩබ්.එල්.එම්.එෆ්. ලෝව් | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | යාපනය |
| 11 | B10 | එල්.ජී. සුදත් රෝහණ | සහකාර බන්ධනාගාර අධිකාරී | අනුරාධපුරය |
| 12 | B11 | ඩබ්.ජී.එන්. ප්‍රනාන්දු | සහකාර බන්ධනාගාර අධිකාරී | බදුල්ල |
| 13 | B12 | ඒ.සී. ගජනායක | සහකාර බන්ධනාගාර අධිකාරී | තල්දෙන |
| 14 | B13 | කේ.යූ.එච්. අක්බාර් | සහකාර බන්ධනාගාර අධිකාරී | මඩකලපුව |
| 15 | B14 | ජේ.සී. වීරසිංහ | බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | ගාල්ල |
| 16 | B15 | ඩබ්.එෆ්.ඩී.සී. කරුණාසේකර | සහකාර බන්ධනාගාර අධිකාරී | මාතර |
| 17 | B16 | එස්.වී.එච්. ප්‍රියංකර | සහකාර බන්ධනාගාර අධිකාරී | වීරවිල |
| 18 | B17 | කේ.ඩබ්.එස්. ධම්මික | සහකාර බන්ධනාගාර අධිකාරී | අගුණකොළපැලැස්ස |
| 19 | B19 | බී.එම්.යූ.ජී.එස්.කේ. බස්නායක | සහකාර බන්ධනාගාර අධිකාරී | කුරුවිට |
| 20 | B20 | ඩී.ආර්.ඩී. දසනායක | සහකාර බන්ධනාගාර අධිකාරී | දළුපොත |
| 21 | B21 | ඩී.ආර්.එස්. සිල්වා | සහකාර බන්ධනාගාර අධිකාරී | ත්‍රිකුණාමලය |
| 22 | B22 | ඩී.ඒ.එම්.එන්. ශාන්ත | සහකාර බන්ධනාගාර අධිකාරී | කළුතර |
| 23 | B23 | ආර්.ඩබ්.ඩබ්.යූ.ඩී.ඒ. සම්පායෝ | සහකාර බන්ධනාගාර අධිකාරී | කෑගල්ල |
| 24 | B24 | එල්.පී.එම්. කරුණාරත්න | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | බූස්ස |
| 25 | B25 | යූ.බී. වලිසුන්දර | බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | වටරැක |
| 26 | B26 | එච්.ඒ.එම්.එස්.බී. සේනානායක | බන්ධනාගාර අධිකාරී | වාරියපොළ |
| 27 | B27 | එම්.එච්.ආර්. අජිත් | සහකාර බන්ධනාගාර අධිකාරී | මොණරාගල |
| 28 | B28 | ඩබ්.කේ.බී. සෙනවිරත්න | සහකාර බන්ධනාගාර අධිකාරී | පොළොන්නරුව |
| 29 | B29 | වී.එම්.පී. රණවක | සහකාර බන්ධනාගාර අධිකාරී | අඹේපුස්ස |
| 30 | B30 | එම්.එෆ්. ලාහීර් | බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | වව්නියාව |

* යම් හෙයකින් ඉහත බලය පැවරූ නිලධාරියෙකු ස්ථාන මාරු නියෝගයක් මත බන්ධනාගාර ආයතනය මාරු වන්නේනම් ස්ථාන මාරු නියෝගය අනුව කටයුතු කල යුතුය.

Annex 02

**Expenditure Statement of December 2018**

Name of the Institute :

| fu | Object Code | Item | Description | Allocation Balance on 1st of December | Expenditure of 1st Dec to 28th Dec | Allocation Balance | Remarks |
|---|---|---|---|---|---|---|---|
| | | | **Personal Emoluments** | | | | |
| 0 | 1001 | | Salaries & Wages | | | | |
| 0 | 1002 | | Overtime and Holiday Pay | | | | |
| 0 | 1003 | | Other Allowances | | | | |
| | | | **Traveling Expenses** | | | | |
| 0 | 1101 | | Traveling - Domestic | | | | |
| 0 | 1102 | | Traveling - Foreign | | | | |
| | | | **Supplies** | | | | |
| 0 | 1201 | | Stationery and office requisites | | | | |
| 0 | 1202 | | Fuel and Lubricants | | | | |
| 0 | 1203 | | Uniforms & Diets | | | | |
| 0 | 1204 | | Medical Supplies | | | | |
| 0 | 1205 | | Others | | | | |
| | | | **Maintenance Expenditure** | | | | |
| 0 | 1301 | | Vehicles | | | | |
| 0 | | 1 | *Minor Repairs* | | | | |
| 0 | | 2 | *Purchasing of Tyre & Tube* | | | | |
| 0 | | 3 | *Servises for Vehicle & Others* | | | | |
| 0 | 1302 | | Plant, Machinery and Equipment | | | | |
| 0 | 1303 | | Building and Structures | | | | |
| | | | **Services** | | | | |
| 0 | 1401 | | Transport | | | | |
| 0 | 1402 | | Postal & Communication | | | | |
| 0 | 1403 | | Electricity and Water | | | | |
| 0 | 1404 | | Rates & Tax to Local Authority | | | | |
| 0 | 1409 | | Other | | | | |
| | | | **Transfers** | | | | |
| 0 | 1506 | | Property Loan Interest | | | | |
| 0 | 1508 | | Other | | | | |
| | | | **Rehabilitation & improvement** | | | | |
| 0 | 2001 | | Building and Structures | | | | |
| 0 | 2002 | | Plant, Machinery and Equipment | | | | |
| 0 | 2003 | | Vehicles | | | | |
| | | | **Acquisition of Capital Assets** | | | | |
| | 2101 | | Vehicles | | | | |
| 0 | 2102 | | Furniture and Office Equipment | | | | |
| | | 1 | *Furniture* | | | | |
| | | 2 | *Information Technology Instruments* | | | | |
| | | 3 | *Security Equipment* | | | | |
| | | 4 | *Training Equipment* | | | | |
| 0 | 2103 | | Plant, Machinery & Equipment | | | | |
| 0 | 2106 | | Software Development | | | | |
| 1 | 2104 | | Co. of Pallekele Prison Complex | | | | |
| 3 | 2104 | | Co. of Jaffna Prison Stage 11 | | | | |
| 5 | 2104 | | Relocation of Prisons in Other Districts | | | | |
| | | 0 | *Building and Structures(Tangalle)* | | | | |
| 9 | 2104 | | Constraction of Mannar Lockup | | | | |
| 0 | 2401 | | **Capacity Building** | | | | |
| | | 1 | *Staff Training - Domestic* | | | | |
| | | 2 | *Staff Training - Foreign* | | | | |
| 7 | 2502 | 0 | Constraction of Headquarters Office .Bld | | | | |
| 8 | 2509 | 0 | Prisoners Rehabilitation Programme | | | | |
| | | | **Recurrent Expenditure** | | | | |
| | | | **Capital Expenditure** | | | | |
| | | | **Total Expenditure** | | | | |
| | | | | **Cash Book Balance :-** | | | |

Prepared By :

Checked By :